IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
(රක්ෂණ කර්මාන්තයේ නියාමක)

INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA

රක්ෂණ ගනුදෙනුකරුවන් වෙත කෙරෙන නිවේදනයයි

ඔබ දේශපාලනිකව අනාවරණය වූ පුද්ගලයෙක් (PEP) ද?

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (AML) නීති යටතේ, රක්ෂණ සමාගම්, තැරැව්කරුවන් සහ රක්ෂණ නියෝජිතයන් දේශපාලනිකව අනාවරණය වූ පුද්ගලයන් (PEPs) වන ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමට අවශ්‍ය වේ.

දේශපාලනිකව අනාවරණය වූ පුද්ගලයෙක් යනු කවුද?

දේශීය වශයෙන් හෝ විදේශීය රාජ්‍යයක් විසින් හෝ ජාත්‍යන්තර සංවිධානයක් විසින් ප්‍රමුඛ රාජ්‍ය කර්තව්‍ය පවරා ඇති යම් පුද්ගලයෙකු, එනම්,

- යම් රාජ්‍යයක හෝ රජයක ප්‍රධානියෙකු,
- දේශපාලන කටයුතුවල නිරත පුද්ගලයකු,
- රජයේ ජ්‍යේෂ්ඨ නිලධාරියකු,
- අධිකරණ ක්ෂේත්‍රයේ ඉහළ නිලධාරියකු,
- යුධ, නාවික, ගුවන් හමුදා හා පොලිසියේ ඉහළ නිලධාරියකු,
- රජයට අයත් සංස්ථාවක/රජයේ හෝ ස්වාධීන ආයතනයක ජ්‍යේෂ්ඨ විධායක නිලධාරියකු (මධ්‍යම මට්ටමේ හෝ කනිෂ්ඨ මට්ටමේ නොවන) හෝ
- ඉහත සඳහන් කළ තැනැත්තකුගේ සමීප පවුලේ සාමාජිකයකු හෝ ආශ්‍රිතයකු

ඔබ කළ යුත්තේ කුමක්ද?

ඔබ ඉහත සඳහන් ඕනෑම කාණ්ඩයකට අයත් නම්, ඔබ රක්ෂණ ගනුදෙනුවක් සඳහා අයදුම් කරන විට හෝ සිදු කරන විට කරුණාකර රක්ෂණ සමාගම, තැරැව්කරු හෝ රක්ෂණ නියෝජිතයා දැනුවත් කරන්න.

මෙම තොරතුරු ඉල්ලා සිටින්නේ ඇයි?

මෙම තොරතුරු රක්ෂණ සමාගම් නීතිමය අවශ්‍යතාවලට අනුකූල වීමට සහ මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම හෝ සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම සඳහා රක්ෂණ නිෂ්පාදන අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීමට උපකාරී වේ.

ඔබ සපයන තොරතුරු ගනුදෙනුකරුවන් තහවුරු කිරීමේ පටිපාටිවලට අනුව කාලානුරූපීව සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම සිදුකරනු ලැබේ.

අදාළ නීති

- 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත
- 2019 අංක 01 දරන රක්ෂණකරුවන්ගේ (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතිය

රක්ෂණ ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීම / ඔබේ ගනුදෙනුකරු හඳුනාගැනීම අන්තර්ජාතික වශයෙන් පිළිගෙන ඇති ක්‍රමවේදයකි. එබැවින් මේ සම්බන්ධයෙන් සියලුම රක්ෂණ ගනුදෙනුකරුවන්ගේ සහාය සහයෝගතාවය ඉතා ඉහළින් අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය කොළඹ 01
දුරකථන අංකය : (011) 2396184-9 ෆැක්ස් : (011) 2396190
විද්‍යුත් තැපෑල : info@ircsl.gov.lk වෙබ් : www.ircsl.gov.lk

SELACINE

IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL IRCSL